**ශීර්ෂය 333 - කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය**

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 333 - කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ 2006.02.00 දරන ආදායම් සංකේතය සඳහා රු.400,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.188,384,750 ක් රැස් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 53 ක් හෙවත් රු.211,615,250 ක් රැස් කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2021 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 220 වන බව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත 2021.08.30 දින දන්වන ලදි. | ආදායම් ඇස්තමේන්තු සැකසීමේදී හැකිතාක් නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.2,100,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | රජයේ වියදම් සමාලෝචනය සම්බන්ධයෙන් වන 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වියදම් සීමා කරන ලද අතර, ඒ අනුව ප්‍රතිපාදන අවශ්‍යතා පැවතියද මෙම ප්‍රතිපාදන අහුරා ගන්නා ලෙස රේඛීය අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. | මු. රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | වැය විෂයයන් 13 ක් සඳහා එකතුව රු.40,300,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් එකතුව රු.23,079,363 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, රු.17,220,637 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 24 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | මු. රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුමේ දක්වා ඇති පහත සඳහන් කාර්යයන්වල අපේක්ෂිත අරමුණු මුළුමණින්ම ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයට අයත් සියලුම මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් ඇති කිරීමට නව මෘදුකාංගයක් ආරම්භ කිරීමේ කාර්යසාධනය සියයට 50 ක සිට සියයට 74 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | නව මෘදුකාංගය ආරම්භ කිරීමේ කාර්යය ඉටුවීමේ ප්‍රගතිය ITMIS ව්‍යාපෘතියේ ප්‍රගතිය අනුව තීරණය වන අතර, එය කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ පාලනයෙන් බැහැර වේ. | ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්ක උපරිමව ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රජයට අයත් සියලුම මූල්‍ය නොවන වත්කම් සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීමේ කාර්යසාධනය සියයට 75 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මූල්‍ය නොවන වත්කම් සඳහා දත්ත පද්ධතිය සකස් කිරීමේ ප්‍රගතිය ලබා ගැනීම සතුටුදායක තත්ත්වයක් විය. | ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්ක උපරිමව ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට කාර්යාලයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 15ක් පැවති අතර, ඉන් 08 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සේවයේ අවශ්‍යතාවය අනුව තනතුරු පුරප්පාඩු පිරවිය යුතු වේ. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම කාර්යාලයේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොවන විට අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ කටයුතු කළ යුතු වීම. |